විප්ලවය 185, 2009 දෙසැම්බර් 13 - revcom.us

# ගෝලීය හදිසි අවශ්‍යතාවය ! පොලෝතලයට සහ මානව වර්ගයාට විප්ලවය අවශ්‍යයි.




ගෝලීය උණුසුම පිළිබඳ සාකච්ඡා කිරීමට 2009 දෙසැම්බර් 18 වන දින ඩෙන්මාර්කයේ කෝපන්හේගන් නුවරදී ලෝකනායකයන් මුණගැසෙති. මෙය ලෝකය පුරා කාගේත් බලාපොරොත්තු ඉහළ නංවා තිබේ. නමුත් කෝපන්හේගන් නුවර සිටින ආඥාදායකයෝ මේ ග්‍රහ ලෝකය ආරක්ෂා කර ගැනීමට වඩා තරඟකාරී වාසිය වැඩි කර ගැනීමට සහ ධනපති ක්‍රමය ආරක්ෂා කර ගැනීමට වැඩි අවධානයක් යොමු කරනු ලැබේ. සමුළුවේ න්‍යාය පත්‍රයේ පරිසර හානි පිළිබඳව සැබෑ තත්ත්වය ඇතුලත්ව නැති අතර මේ ප්‍රශ්නය විසඳීමට සැබෑවටම අවශ්‍ය කරනු ලබන්නේ කුමක්ද.

1

මේ ධරණීතලය අනිවාර්ය සහ හදිසි තත්ත්වයකට මුහුණ දී සිටී. මහත් විශාල විනාශයක් වර්ධනය වෙමින් පවතී. මේ පෘථිවියේ සමස්ත ජීවය රැඳා පවතින ශාක පද්ධති, සතුන්, ජලය, පස සහ වාතය යන මේ සියල්ල විනාශ වෙමින් පවතී, සදහටම වෙනස්කම් වලට ලක්වන අතර හානියට නතු වේ.

ගල් අඟුරු, තෙල් සහ වායු දහනය සහ වැසි වනාන්තර විනාශය නිසා මුහුදේ සහ වායුගෝලයේ උණුසුම ඉහළ යයි. වැඩි වන වේගයකින් යුතුව ග්ලැසියර සහ ධ්‍රැවයන්හි අයිස් ද්‍රව බවට පත් වෙයි. ඉහළ යන ගෝලීය උණුසුම හේතුකොට ගෙන අති බලවත් කුණාටු ඇති කරයි; කාලගුණ තත්ත්වය විකෘති කරයි. අප්‍රිකාව තුළ විශාල ප්‍රමාණයක් මිනිසුන් නිරන්තරයෙන් යුද්ධයෙන්, දරිද්‍රතාවයෙන්, සහ ආහාර හිඟ කමින් පීඩා විඳිනු ලබයි - මෙය අතිශය ප්‍රබල විනාශයකට මග පාදනු ඇත.


ඉන්දුනීසියාවේ දැවී ගිය වැසි වනාන්තරයක්.

පෘථිවියේ ඉරණම ඉතා අනතුරුදායක තත්ත්වයක පවතී. මෙය විද්‍යාත්මක කාරණයකි: එපමණක් නොව පෘථිවි පරිසර පද්ධතියේ මහත් පුදුම සහගත සහ නොවැලැක්විය හැකි විනාශයන් ඇති වනු ඇත, නැත්නම් පරිසරය සමග මිනිසාට අන්‍යෝන්‍ය



ඔරංඔටං - කලිමන්තාන්, ඉන්දුනීසියාව.

සේ බලපවත්වන තත්ත්වයන්හි අතිවිශාල මෙන්ම විශ්වනීය වෙනස්කම් ඇති වනු ඇත.

2

අද වන විට ලෝකයේ වනාන්තර වලින් 50% ක් අවසන්ව ඇත. ඉතිරිව පවතින වැසි වනාන්තර පෘථිවියේ පවතින විශේෂයන්ගේ විවිධත්වයෙන් පොහොසත්ය (සප්‍රාණීන්ගේ සම්මිශ්‍රණයක් ඇති). නමුත් ඒවා සියල්ල ඇදහිය නොහැකි වේගයකින් අතුගා දැමෙමින් පවතී. විශේෂයන්ගේ (ජීවීන්ගේ) වත්මන් වඳවීයාම ඇස්තමේන්තු කිරීමට අනුව එය ස්වභාවිකව හෝ සාමාන්‍යයෙන් සිදුවනවාට වඩා 1000 වාරයකින් විශේෂයන් අභාවයට යෑම සිදු වේ. ලෝකය පුරා පස, වාතය සහ ජලය එකසේ අපවිත්‍රව ඇත. ඇත්තෙන්ම පෘථිවිතලය මත වෙසෙන සෑම පුද්ගලයෙකුගේම හඳුනාගත යුතු මට්ටමකින් කෘමිනාශක වැනි විෂ ද්‍රව්‍ය අන්තර්ගතව ඇති සේම මේවා පිළිකා, අංග විකල දරු උපත් සහ වෙනත් හානිකර සෞඛ්‍ය තත්ත්වයන් ඇති කරයි. අද ලෝකයේ විශාල මුහුදු තීරයන්හි 75% කට වැඩියෙන් මසුන් අල්ලයි. වායුගෝලයට මුදාහරින වැඩි වන කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය මුහුදු ජලයට අවශෝෂණය වීමෙන් විශාල ලෙස ආම්ලික වීම නිසා සාගර ජලයේ උෂ්ණත්වය ඉහළ ගොස් ඇත. පෘථිවියේ අලංකාර මුහුදු ජීවීන්ට නිවහන් සපයන කොරල්පර වලට මෙය තර්ජනයකි. එමෙන්ම මුහුදු තීරය තුළ ජීවීන්ට වාසය කළ නොකලහැකි ප්‍රදේශ වැඩි වෙමින් පවතී.

ඇමෙරිකාව ලෝක ජනගහනයෙන් 5% ක් නියෝජනය කරන නමුත්, ලෝකයට මුදා හරින කාබන් වලින් 25% ක් ඔවුන් විසින් මුදා හරිනු ලැබේ. පොහොසත් ධනපති රටවල් පරිසර විනාශයේ වැඩි ප්‍රමාණයකට වග කිව යුතුය. නමුත් මේ විපාකයන්ගෙන් වැඩි වශයෙන් පීඩා විඳිනුයේ තුන්වන ලෝකයේ රටවල දිළිඳු ජනතාවයි.

3

පෘථිවිය විනාශ වන්නේ ''ස්වාභාවික ක්‍රියාදාමයන්'' හෝ ''මිනිසාගේ කෑදරකාරී ස්වභාවය'' නිසා නොව, එක් හෝ බොහෝ සම්පත් හොඳටම සූරා කමින් වාසියම ලැබීමේ නිෂ්පාදනය සඳහා ඒවා භාවිතා කිරීමට සැලකිලිමත් වන ස්වභාවය වූ ධනවාදී - අධිරාජ්‍යවාදී ක්‍රමයේ සවභාවය නිසා සහ ක්‍රියාකාරකම් නිසාය.

ධනවාදයට අනාගතය සඳහා සැලසුම්සහගතව හෝ, පරිසරය සමග සීමාකාරී පිලිවෙතකින් හෝ එයට දරාගත හැකි ලෙසට කටයුතු කළ නොහැකිය. එහි තර්කය වන්නේ ''සියල්ලටම ඉහළින් ලාභය'', ''ව්‍යාප්තිය හෝ විනාශයයි''. එහි ආර්ථිකය පැදවෙනු ලැබන්නේ නිතිපතා ධනවාදීන් අතරම එහි අනෙක් තරඟකරුවන්ට වඩා වැඩි වාසි උපයා ගැනීමට තැත් දැරීමේ නිර්දය තරඟය මගිනි. මානව ප්‍රජාවෙන් 20% කට පිරිසිදු පානීය ජලය නොමැතිකමට ධනනවාදී ක්‍රමය දෙන ''විසඳුම'' වනුයේ ජලය පෞද්ගලීකරණය කිරීම සහ ලාභ ඉපැයීමට ඒවා විකිණීමයි.

ධනවාදී නිෂ්පාදනයේ දැඩි ස්වභාවය වනුයේ පුද්ගලිකත්වය සහ හුදෙක් එකෙකා තමාගේම ව්‍යාප්තිය සඳහා යොමුවෙන, ''ධනවාදීන්'' අතර ඇති ඉමහත් තරඟයෙන් ආර්ථිකය ඉදි කිරීමයි. ධනවාදීහු සිය අභිවෘද්ධිය වෙනුවෙන් පාම්තෙල් සෑදීමට සහ දැව ලබා ගැනීමට වැසි වනාන්තර කපා හෙලන විට, අතිමහත් කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණයක් පරිසරයට මුදා හැරීම හෝ සෑම ප්‍රදේශයකට ඔරංඔටන් සහ සුමාත්‍රා කොටින්ගේ (වෙනත් බොහෝ විශේෂයන් ඇතුළුව) නිජබිම් වැනසෙන ප්‍රමාණයන් ආදී මේ කිසිවක් තැකීමකට ගන්නේ නැත.

4

පරිසර අර්බුදයට අත වනන හානිදායක නිෂ්පාදන බලවේග සහ තාක්‍ෂණය මේ වන විටත් ඔවුන් සතුව ඇත. වැදගත් කාරණයක් වනුයේ, පෘථිවිය විනාශවීම වැළැක්වීම සඳහා විසඳුම් සෙවීමට කටයුතු කළ හැකි සහ මග පෙන්විය හැකි, අති විශාල දැනුමක් සතු මෙන්ම වැඩි දියුණු කළ හැකි නිර්මාණශීලීත්වයක් ඇති බිලියන ගණන් ජනතාවක් ලෝකය පුරා ජීවත්වීමයි.

පෘථිවිය මේ ඉරණමෙන් ගලවා ගැනීමට කොමියුනිස්ට් ලෝකයක ඉලක්කය ඇතිව, සමාජවාදී සමාජයක් ඉදි කිරීමට අපිට විප්ලවය අවශ්‍යයි. සමාජවාදය යටතේ මානවයාට පරිසරය සමග අන්‍යෝන්‍යව ඊට දරාගත හැකි, සුදුසු ක්‍රමයන් මගින් සවිඥාතව නිෂ්පාදනය පාලනය කිරීමට සහ පරිසර විනාශය නැවැත්වීමට කටයුතු කළ හැකිය. සමාජවාදී සමාජයේ නිෂ්පාදන බලවේගයන්ගේ අයිතිය සහ පාලනය සමාජමය වන අතර එය ආර්ථිකය සැලසුම් කරන්නේ වාසි ලැබීමට නොව ජනතාවට සේවය කිරීම පිණිසයි. සංවර්ධනයේදී සහ ආර්ථික සැලසුම්කරණයේදී

පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම මධ්‍යම හා පුමුඛ කාර්යයක් ලෙස සලකනු ලබයි. හැඟීමෙන් යුතුව පරිසරය ආරක්ෂා කිරීමේ වගකීම සහ එය අගය කිරීම ජනතාව උගනීවි.

සමාජවාදය යටතේ මහජනතාව වූ කලී විශිෂ්ඨ වූ තනි සම්පතකි. තවද මානව වර්ගයා සත්‍ය ලෙසම ආරක්ෂා කර ගැනීමට සහ පෘථිවිය මත ජීවය සුරැකීමට, සමාජය ගොඩ නගන්නේ කෙසේද යන්න පැහැදිලි කර ගැනීමට ඔවුන් සියල්ලගේම නිර්මාණශීලී ශක්තිය, දැනුම සහ සංකල්පනාවන්, ජනතාව අරගලය සඳහා ඒකාග්‍ර කිරීම, සාකච්ඡා කිරීම, තර්ක හා විවාද කිරීමට මෙන්ම එකට එක්ව වැඩ කිරීමද කළ යුතුය. මේ ක්‍රමයෙන් මානව සමාජයට, වනාන්තර, මවිත කරවන සුන්දරත්වය සහ ස්වභාවයේ ඇති විවිධත්වය ඇගයීමට හැකි වන අතර ග්‍රහ ලෝකයේ ආරක්ෂකයන් ලෙස සවිඥාතව ක්‍රියා කළ හැකිය.



ගම්වැසියන් ගං වතුරට හසු වී, බංගලාදේශයේ ඩකාවලට නුදුරින්, 2008.

සමාජවාදී සමාජය පරිසරය සමග ඊට ගැලපෙන ලෙස වඩාත් අවශ්‍ය වන මෙන්ම සිදු කළ හැකි ලෙසට ආර්ථික සංවර්ධනය සිදුකරයි. විප්ලවීය ඇමෙරිකන් කොමියුනිස්ට් පක්ෂයේ සභාපති, බොබ් එවේකියන් සමාජවාදයට සහ කොමියුනිස්ට්වාදයට නැවත පිවිසීම සංවර්ධනය කරනු ලබයි - පාරිසරික පෙරමුණක් මත, වඩා ශක්තිමත් අත්තිවාරමක් මත තවදුරටත් ගමන් කරන්ට සහ වඩා හොඳින් සත්‍ය විමුක්තිකාමී සමාජයක් ඉදි කරන්ට මග සලසන වඩා උද්දීපිත සහ විද්‍යාත්මක කොමියුනිස්ට්වාදය.

ඔබට අවශ්‍ය නම් ලෝකය පුරා ජනතාව සමෘද්ධිමත් ලෙස ජීවත් වනු දකින්නට.... විශ්වයේ භාරකරුවන් ලෙස අප එක්ව ක්‍රියාකරන්නේ කොතැනකදීද....ස්භාවික ලෝකය සහ වනාන්තර අගයකර ආරක්ෂා කරන්නේ කොතැනකදීද....මේ විප්ලවය ග්‍රහණය කර ගන්න, ලෝකය පුරා දැන්ම එය පතුරුවන්න. මුළු මහත් පෘථිවියේම සහ මිනිස් වර්ගයාගේම ඉරණම දැඩි අනතුරක පවතී....මුළු මහත් ලෝකයම දිනා ගැනීමට අපට ඇත.

පරිසරය සහ මානව ඉරණම ව්‍යසනයේ අද්දරට ගෙනෙමින් පවතී.

මේ ක්‍රමයේ අණකිරීම් සියල්ලම නිසා - මිනිස් ප්‍රජාව මත මහත් අවහිරයක් ඇති කරයි. පෙර කවරදාවත් සිතන්ටවත් නොහැකි ආකාරයෙන් - තාක්ෂණය සහ ධනය විද්‍යාමාන වන අතර බලවතුන්ව හඳුනන්නේ නැති අප්‍රසිද්ධ අය කෝටි ගණනින් දශලක්ෂ ගණනින් නිෂ්පාදනය කරයි. තාක්ෂණය සහ ධනය, ද්‍රව්‍යමය, බුද්ධිමය, සංස්කෘතිකමය වශයෙන් ජීවිත සදාකල්හි දියුණු කරන්ටත්, කොහේ වුණත් ජනතාවගේ අවශ්‍යතාවයන්ට මුහුණ දෙන්ට සුදුසු සම්පූර්ණයෙන්ම මිනිස් ප්‍රජාවට අයිතිවෙන උපකරණයක් විය යුතුය.

**විප්ලවය අපට අවශ්‍යය...නායකත්වය අපට ඇත...**
**ඇමෙරිකාවේ විප්ලවීය කොමියුනිස්ට් පක්ෂයෙන් හඬ ගැසීමක්, පණිවිඩයක්**



බ්‍රසීලයේ කරෙයිරෝ ද වාර්ෂියා (Careiro da Varzea) නගරයට ආසන්නයේ පිහිටි රෙයි (Rei) වැවේ ඉවුර මත මියගිය මත්ස්‍යයින් පරීක්ෂා කරන මිනිසෙක්. 2005 වසරේදී මාස ගණනක් පුරා පැවති තද ඉඩෝරය හේතුකොටගෙන ඇමෙසන් ගඟේ ජල මට්ටම අඩි කිහිපයකින් පහළ බැස තිබුණි. 2009 වසරේදී ප්‍රජාව විසින් ගං වතුර සමයේ නැවතී සිටීමට තාවකාලික මහල් නිවාස ගඟ දිගේ සාදනු ලැබුණි.

ලෝකයේ ප්‍රමුඛ පෙළේ කාලගුණ විද්‍යාඥයෙක් ළඟ එන කෝපන්හේගන් කාලගුන සමුළුව ගැන නොවළහා කතා කරමින් ප්‍රකාශ කර සිටියේ, සමුළුව අවසානයේ නම් ඔවුහු ග්‍රහලෝකයේ සහ අනාගත පරපුරුවල යහපත ගැන කතා කරාවි.

නාසා හි අභ්‍යවකාශ අධ්‍යනය පිළිබඳ ගොඩාඩ් ආයතනයේ ජේම්ස් හැන්සන් (James Hansen) එක්සත් රාජධානියේ ගාඩියන් (Guardian) ප්‍රවෘත්ති පත්‍රයට ප්‍රකාශ කර තිබුණේ කාලගුණය පිළිබඳ කතිකාවන් ආරම්භයේදීම ඉක්මනින් බිඳ වැටෙන දැඩි වැරදිවලින් ගහණ බවයි. තවද ඔහු කියා සිටියේ ''සත්‍ය ලෙසම අපට අවශ්‍ය දෙය වටහාගත් සහ ප්‍රකාශ කරන නායකයෙකු නොමැත. ඒ වෙනුවට අපි සාමාන්‍ය කටයුතු පවත්වාගෙන යන්නෙමු''. හැන්සන් බැරැක් ඔබාමා ව දැඩි ලෙස විවේචනය කරයි - and even Al Gore - පරිසරයේ මහා භාරකරු ලෙස පෙනී සිටින්නේ කවුද?

සිහියට ගන්න, හැන්සන් 1970 ට පෙර සිටම ගෝලීය උණුසුම ගැන අනතුරු හැඟවූ සහ මේ පිළිබඳව පුරෝගාමී පරීෂණ වල යෙදුණු එක් විද්‍යාඥයෙකි. පෘථිවි කාලගුණයට කුමක් සිදුවේද යන්න සහ ලෝකයේ විශාලතම ආර්ථිකයේ ශක්ති යෙදීම් මගින් ඇති කරන හානි ගැන ජනතාවට සත්‍ය කරුණු ප්‍රකාශ කරමින් සිටින ඔහු අදහස් නොසඟවා ප්‍රකාශ කරයි, අඩුම තරමින් ප්‍රබල බලවතුන්ගේ ප්‍රහාර නොතකා ඔහු ඇමෙරිකාවේවත් දැඩි ස්ථාවරයක සිටී. බුෂ් පරිපාලනය පිට පිටම හැන්සන්ගේ අදහස් මඩින්නට මෙන්ම ඔහු ඉදිරිපත් කරන දෑ සහ ඒවා පුළුල් බහු ජනතාව වෙත ළඟා වීම වැලැක්වීමට කටයුතු කළේය.

ගෝලීය උණුසුම ගැන අනතුරු හැඟවීම පිළිබඳ හැන්සන්ගේ ක්‍රියාකාරිත්වය ජනතාවගේ දැන ගැනීම සඳහා ඉතා වැදගත්ය.

ලෝක ආර්ථිකයේ ශක්ති භාවිතාව හේතු කොටගෙන ඇතිවුණු ගෝලීය උණුසුම සමග කටයුතු කිරීමට කෝපන්හේගන් සමුළුවේදී ඇති කරගත් ඇතැම් සමගි සම්මුතීන් කියාපාන පරමාර්ථ අරභයා හැන්සන් මෙසේ ප්‍රකාශ කළහ.

''මෙය වහල්භාවය ප්‍රකාශවීමට සමානයි... මේ වර්ගයේ ප්‍රකාශවීම් සමග ඔබට සමථයකට එළඹිය නොහැකියි. දැන් එය 40% හෝ 50% පහත දමන්න පාලනය කරන්න, වහල්භාවය පහත දමන්න ඔබට කියන්ට හැකිකමක් නැහැ.''



ඉතියෝපියාවේ ඩෙනාන් (Denan) කලාපයේ තද නියඟය, 2006.

නව මාක්ස්වාදී අධ්‍යයන කණ්ඩායමේ පරිවර්තනයකි
අංක 15

http://slmarxist.yolasite.com
slmarxist@ymail.com